**සිරකරු සුභසාධක අරමුදල - 2022**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

සිරකරු සුභසාධක අරමුදලේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළඅරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර ආයතන වෙත ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.7,860,139 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබීම් හා තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියලුම වත්කම් (මිලදී ගන්නා සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන ස්ථාවර හා පාරිභෝජන ද්‍රව්‍ය ) විසර්ජන ගිණුම මගින් ගිණුම් ගතකිරීමට කටයුතු කරන බැවින් සිරකරු සුභසාධක අරමුදල සඳහා වත්කම් ගිණුම් ගතකිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගැනීම අවශ්‍ය නොවේ. | පාරිභෝජ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතුය. |

### 1.5.2. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 2,371,275 | භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව අරමුදලේ ජංගම නොවන වත්කම් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරමින් 2021 වර්ෂයේ දී 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබුණු අතර එදිනට නොමිලේ වත්කම් ප්‍රදාන ගිණුමේ රු.24,350,099 ක ශේෂය වත්කම් ඉවත් කිරීමේ ගිණුම තුලින් ගැලපීම නිසා ජංගම නොවන වත්කම්වලට අදාළව රු.12,640,730 ක ඉවත් කිරීමේ අතිරික්තයක් නිරූපනය විය. මෙම | මධ්‍යම රජය, බන්ධනාගාර කර්මාන්ත අංශය හා සිරකරු සුභ සාධක අංශය යන සියලු ගිණුම් මගින් පෙන්වා ඇති වත්කම් බන්ධනාගාර ආයතන තුල පවතින අතර එම සියලු වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම ප්‍රායෝගිකව අපහසු අතර ද්විගණන දෝෂයක් ඇතිවීමේ හැකියාව පවතී. එම නිසා වත්කම් නැවත නැවත ගිණුම් ගත වීමෙන් ද්වි ගණන | වත්කම් නැවත ප්‍රකාශ කිරීමට පෙර එම වත්කම් පැහැදිළිවම භෞතිකව හඳුනාගෙන ඒවා ගිණුම්ගත කළ යුතුය. |

| | |
|---|---|
| අතිරික්තය 2022 දෙසැම්බර් 31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිතවල ඇතුළත් වී ඇත තවද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කළ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ මෙම වත්කම් වාර්තා කර තිබුණ ද මෙම වත්කම් භෞතිකව නිශ්චිතව හඳුනාගෙන ගිණුම් පොත්වල වාර්තා කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | දෝෂය ඇති වීම වැලැක්වීම පිණිස මෙම සියළු අංශ සතු වත්කම් විසර්ජන ගිණුම මගින් දැක්වීමෙන් දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් එක් ගිණුමක් මගින් ඉදිරිපත් කිරීමට 2020 වර්ෂයේ සිට කටයුතු කර ඇත. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i.) 237 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී ගෙවීම් වවුචරයේ භාණ්ඩ ලැබී ඇති බවට හා අදාළ බඩු ලේඛනයේ තොග පොත්පත් යනාදියේ එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට සහතිකයක් අමුණා තිබිය යුතුය. නමුත් වැලිකඩ, බූස්ස හා වටරැක බන්ධනාගාරවල සිරකරු සුභසාධක අරමුදලින් මිලදී ගත් රු.205,002 ක භාණ්ඩ තොගපොත්වල ඇතුළත් කර නොතිබූ අතර ගෙවීම් වවුචර් වලද අදාළ ද්‍රව්‍ය ලැබුණු බවට සටහන් ඇතුළත් වී නොතිබුණි. | බන්ධනාගාර ආයතන වල පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීමට අවශ්‍ය උපදෙස් මුදල් කොමසාරිස්තුමාගේ 2023 මාර්තු 28 දිනැති ලිපිය මඟින් සියලු ආයතනවල බන්ධනාගාර අධිකාරීවරු දැනුවත්කර ඇති අතර මඟින් 2023 වසරේ සිට අදාළ කාර්තුවෙන් කාර්තුවට ගිණුම් වාර්ථා මූලස්ථානය වෙත ගෙන්වීමට කටයුතු කර ඇත. විශේෂයෙන් අදාළ වැලිකඩ, බූස්ස හා වටරැක යන ආයතන වල අධිකාරීවරුන් හා ඊට අදාළ පුනරුත්ථාපන නිලධාරීන් හා උපකරණ ගබඩාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 237 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii.) | 877 (2) (අ) | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර සුහසාධක අරමුදලේ ගණුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි. | සිරකරු සුහසාධක අරමුදලට වෙනම බැංකු ගිණුමක් විවෘත කිරීමට අදාළ කටයුතු මේ වන විටත් සිදුකර ඇති අතර 2022 නොවැම්බර් 29 දිනැති ලිපිය අමාත්‍යාංශ අනුමැතිය සඳහා යොමු කර ඇත. | මුදල් රෙගුලාසි 877(2)(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.758,638 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.908,830 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 150,192 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයේ දී අරමුදල මගින් කිසිදු වියදමක් සිදු නොකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී රු.1,884,382 ක වියදම් සිදු කිරීම මෙම පිරිහීමට හේතු විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ ප්‍රගතිය මැනිම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දී නොතිබූ අතර බන්ධනාගාරවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගි කළ යුතු සිර/ සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය ඇතුළත්ව පූර්ව සැලසුම් සකස්කර එම සැලැස්මවලට අනුව ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා අරමුදලේ අරමුණු ඉටුකිරීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | සිරසුහසාධක අරමුදලේ කටයුතු යාවත්කාලීන කර පවත්වාගෙන යාම සඳහා සාමාජිකයන් 07 දෙනෙකුගෙන් යුත් පාලන කමිටුවක් පත් කිරීමට මේ වන විටත් පියවර ගෙන ඇත. එම කමිටුව මගින් 2023 වසරට අදාළ සිර සුහසාධක ගිණුමට අදාල ප්‍රගතිය හා කාර්ය සාධනය සමාලෝචනය කෙරේ. | අරමුදලේ වැඩසටහන් සඳහා පූර්ව සැලැස්මක් ද එම සැලැස්මට අනුව කාර්යසාධනය ඇගයීමට කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඇගයීම් සිදු කොට ප්‍රගතිය වාර්තා කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ අයවැය මගින් සිරකරු සුහසාධනය සඳහා රුපියල් මිලියන දෙකක් වෙන් කර තිබුණද එම මුදල් ප්‍රමාණවත් නොවීම නිසා | සිරකරු සුහසාධක අරමුදලේ ආදායම් අවිනිශ්චිත ආදායම් වන බැවින් අරමුදලේ ශේෂය ඉතා අඩු මට්ටමකට පවතී. සිරකරුවන්ගේ සුහසාධනය වෙනුවෙන් උපරිම මට්ටමක් ලබා කර | ප්‍රමාණවත් ප්‍රතිපාදන සම්පාදනය කර ගැනීමට කටයුතු කර, අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගත හැකිවන |

දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් වැය විෂයයන් 03 ක් යටතේ රු.2,377,848,334 ක මුදලක් වැය කර තිබුණු අතර අරමුදලේ ඇස්තමේන්තු ගත ලැබීම් ප්‍රමාණය රු.1,437,250 ක් වුවද සත්‍ය ලැබීම් ප්‍රමාණය රු.2,651,796 ක් වූයෙන් අයවැය ගත ලැබීම් ප්‍රමාණයට වඩා සත්‍ය ලැබීම ප්‍රමාණය රු.1,214,546 ක් එනම් සියයට 84.5 කින් වැඩි තිබුණි. තවද අරමුදලේ ලැබීම් ශීර්ෂ 10 ක් අතුරින් ලැබීම් ශීර්ෂ 07 කම අයවැයගත ආදායම හා සත්‍ය ආදායම අතර වෙනස සියයට 100 සිට සියයට 4,063 ක් දක්වා පරාසයක් තුළ විචලනය වූ බැවින් අයවැය ඇස්තමේන්තුව තාත්විකව සකස් කර පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

ගැනීමට නම් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් අවශ්‍ය වේ.

මෙම අයවැය ගත ආදායම පිළිබඳව ඔබගේ නිරීක්ෂණ සමඟ එකඟ වන අතර එම තත්වය පසුගිය වර්ෂ 03ක ගිණුම් වාර්තා සමඟ සැසඳීමේ දී නිරීක්ෂණය වේ. එම තත්වය නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු ආකාරය හා අප විසින් වියදම් දැරිය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡාකර තීරණයකට එළඹීමට බලාපොරොත්තු වන අතර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කළ සිරකරු සුබසාධක අරමුදල් පාලන කමිටුව වෙත ඉදිරිපත් කර නිරාකරණය කිරීමට බලාපොරොත්තු වේ.

ආකාරයට කටයුතු කළ යුතුය.

අරමුදලේ අයවැය ඇස්තමේන්තුව තාත්විකව සකස් කර පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.